10179

OL/2023(2024)/87/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 | S | I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
## General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II**
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

### සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** මුද්‍රණ ශිල්පය මෙරටට හඳුන්වාදෙන ලද්දේ,
(1) ලන්දේසීන් ය. (2) පෘතුගීසීන් ය.
(3) බ්‍රිතාන්‍යයන් ය. (4) චීන ජාතිකයන් ය.

**2.** අන්තර්පුද්ගල සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි තාක්ෂණික මෙවලම් දැක්වෙන වරණය තෝරන්න.
(1) පුවත්පත්, ෆැක්ස් යන්ත්‍රය (2) විද්‍යුත් තැපෑල, දුරකථනය
(3) ගුවන්විදුලිය, ෆැක්ස් යන්ත්‍රය (4) ජංගම දුරකථනය, රූපවාහිනිය

**3.** බ්‍රිතාන්‍ය යටත් විජිතයක ස්ථාපනය කරන ලද ප්‍රථම ගුවන්විදුලි සේවය නිල වශයෙන් විවෘත කරන ලද්දේ,
(1) 1920 අගෝස්තු 20 ය. (2) 1924 ජුනි 12 ය.
(3) 1925 දෙසැම්බර් 16 ය. (4) 1949 ඔක්තෝම්බර් 05 ය.

**4.** සමූහ සන්නිවේදනය මූලික වශයෙන් අර්ථ දැක්විය හැකි වන්නේ,
(1) එම ක්‍රියාවලියට සම්බන්ධ පුද්ගල සංඛ්‍යාව මත ය.
(2) කණ්ඩායම වාචික සන්නිවේදනයේ යෙදීම මත ය.
(3) සියලු දෙනා එකිනෙකාට සම්මුඛව සිටීම මත ය.
(4) එකවර සමූහයට සන්නිවේදනය කිරීමට හැකිවීම මත ය.

**5.** ලෝකයේ පළමු ග්‍රන්ථය ලෙස සැලකෙන්නේ,
(1) ලතින් ව්‍යාකරණයයි. (2) වජ්‍ර සූත්‍රයයි.
(3) ලතින් බයිබලයයි. (4) ලන්දේසි යාඥා පොතයි.

**6.** පුවත්පතක ප්‍රවෘත්ති පිටු සංස්කරණය කරනු ලබන්නේ,
(1) ප්‍රධාන කර්තෘ විසින් ය. (2) උප කර්තෘවරු විසින් ය.
(3) නියෝජ්‍ය කර්තෘ විසින් ය. (4) සම කර්තෘ විසින් ය.


**7.** අවාචික සන්නිවේදනයට අදාළ වරණය කුමක් ද?
(1) ඇඳුම් පැළඳුම්, කට හඬ, අභිනය (2) අත වැනීම, පෞද්ගලික දුර, සන්නස
(3) ගුහා චිත්‍ර, සෙල්ලිපි, බෙර හඬ (4) පුස්කොළ පොත, පෞද්ගලික දුර, සිතියම

[දෙවැනි පිටුව බලන්න.

8. පුවත්පතක පෙළ (Text) හා රූප (Image) යන්නට පිළිවෙළින් අයත් වන්නේ කුමක් ද?
(1) අකුරු හා සිරස්තල (2) වචන හා කාටූන්
(3) වාක්‍ය හා ඡේද (4) ඡායාරූප හා සටහන්

9. නීත්‍යානුකූල දේශසීමාවක් තුළ ජීවත්වන තැනැත්තා හඳුන්වන නාමය කුමක් ද?
(1) සංචාරකයා (2) පුරවැසියා (3) ඡන්දදායකයා (4) බදු ගෙවන්නා

10.



ඉහත රූපසටහන මගින් නියෝජනය කෙරෙන්නේ,
(1) තනි දාමයයි. (2) පර්ෂද දාමයයි.
(3) සම්භාවිතා දාමයයි. (4) ඕපාදූප දාමයයි.

11. පරිගණකය ආශ්‍රිතව භාවිත කළ හැකි මුද්‍රණ යන්ත්‍ර වර්ගයක් **නොවන්නේ,**
(1) ඡායා පිටපත් යන්ත්‍රයයි. (2) රෝනියෝ යන්ත්‍රයයි.
(3) බබල් ජෙට් මුද්‍රණ යන්ත්‍රයයි. (4) ලේසර් මුද්‍රණ යන්ත්‍රයයි.

12. පුවත්පතක් හා සම්බන්ධ නඩු කටයුත්තක දී එහි වගකීම දරනු ලබන්නේ,
(1) ප්‍රධාන කර්තෘ විසිනි. (2) නියෝජ්‍ය කර්තෘ විසිනි.
(3) උප කර්තෘ විසිනි. (4) ප්‍රවෘත්ති කර්තෘ විසිනි.

13. ක්‍රිකට් ලෝක කුසලාන අවසන් මහා තරගයේ සජීවී රූපවාහිනී විකාශය පුළුල් තිර ඔස්සේ ප්‍රසිද්ධ ස්ථානවල දී ප්‍රේක්ෂකයින්ට දැකබලා ගැනීමේ අවස්ථාව උදාවිය. මීට අදාළ සන්නිවේදන වර්ගය හා ස්වරූපය වන්නේ,
(1) සමූහ හා දෘශ්‍ය සන්නිවේදනයයි.
(2) ජන හා දෘශ්‍ය සන්නිවේදනයයි.
(3) ජන හා සමූහ සන්නිවේදනයයි.
(4) දෘශ්‍ය හා අන්තර්පුද්ගල සන්නිවේදනයයි.

14. ශ්‍රී ලංකාවේ පළමු රූපවාහිනී සේවය ආරම්භ කරනු ලබන්නේ,
(1) පෞද්ගලික හිමිකම යටතේ ය. (2) රාජ්‍ය හිමිකම යටතේ ය.
(3) රාජ්‍ය සංස්ථාවක් ලෙසිනි. (4) රජය සතු කොටස් හිමි සමාගමක් ලෙසිනි.

15. අන්තර්ජාල පහසුකම් යොදාගනිමින් යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් පවත්වාගෙන යනු ලබන විද්‍යුත් තොරතුරු ඇතුළත් ගොනුව,
(1) විශ්වකෝෂයයි. (2) විද්‍යුත් තැපෑලයි.
(3) විද්‍යුත් කැඳවනයයි. (4) වෙබ් අඩවියයි.

16. වර්තමාන ශ්‍රී ලාංකේය ගුවන්විදුලි නාලිකා සිය සම්ප්‍රේෂණ සඳහා බහුල වශයෙන් යොදාගන්නා තරංග වර්ගය වන්නේ,
(1) කෙටි තරංග (SW) ය. (2) මධ්‍යම තරංග (MW) ය.
(3) සංඛ්‍යාත මූර්ජන තරංග (FM) ය. (4) විස්තාර මූර්ජන තරංග (AM) ය.

17. සිංහල මාධ්‍ය පුවත්පත්වල දෙමළ හා මුස්ලිම් ප්‍රජාවට අදාළ ප්‍රවෘත්ති ප්‍රමාණවත් ලෙස පළ **නොවීම** අදාළ වන්නේ,
(1) මානව හිමිකම්වලට ය. (2) පුරවැසිභාවයට ය.
(3) වාර්ගිකත්වයට ය. (4) සංවර්ධනාත්මක චින්තනයට ය.

18. වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මාධ්‍ය යනු ලාභදායී ව්‍යාපාරයකි.
(2) මාධ්‍ය මගින් ප්‍රවෘත්ති ඉදිරිපත් කරනු ලබයි.
(3) මාධ්‍ය කර්මාන්තය හැමවිටම තරගකාරී ය.
(4) මාධ්‍ය යනු තොරතුරු අලෙවිය පාදක කරගත් ව්‍යාපාරයකි.

[තුන්වැනි පිටුව බලන්න.

19. කිසියම් විධායක නිලධාරියෙකු තම අත්සන සමග නිල මුද්‍රාව තැබීම වඩාත් වැදගත් වන්නේ, එමගින්
(1) සුරක්ෂිතතාව ලැබෙන බැවිනි.
(2) විශ්වසනීයත්වය තහවුරු වන බැවිනි.
(3) නීත්‍යානුකූල වලංගුභාවය ලැබෙන බැවිනි.
(4) අනුමැතිය හා වගකීම තහවුරු වන බැවිනි.

20. පහත රූපසටහනෙහි දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රියාවලියට අදාළ පියවර කිහිපයකි.

සන්නිවේදකයා ⟶ [   ] ⟶ [   ] ⟶ ග්‍රාහකයා ⟶ බලපෑම

මෙහි හිස් කොටුවලට අදාළ පියවර අනුපිළිවෙළින්,
(1) සන්දේශය හා සංඥායි.
(2) සන්දේශය හා මාධ්‍යයයි.
(3) සම්ප්‍රේෂකය හා සන්දේශයයි.
(4) සන්දේශය හා සම්ප්‍රේෂකයයි.

21. සරල වාක්‍ය රටා, නිවැරදි උච්චාරණය හා නිරවුල් භාෂාවකින් යුක්ත වීම යන ලක්ෂණ ඇතුළත් වන ප්‍රවෘත්ති ගුණාංගය වන්නේ,
(1) නිවැරදි බවයි. (2) සමතුලිත බවයි. (3) පැහැදිලි බවයි. (4) සරල බවයි.

22. පුවත්පත් ප්‍රකාශනය කිරීමට අදාළ පියවර කිහිපයක් පහත දැක්වේ.
A – ප්‍රවෘත්ති රචනය
B – භාෂා සංස්කරණය
C – ප්‍රවෘත්ති/විශේෂාංග වර්ගීකරණය
D – පිටු සැකසුම
E – සෝදුපත් කියවීම

ඉහත පියවරවල නිවැරදි අනුපිළිවෙළ වන්නේ,
(1) A, B, D, C, E ය. (2) C, A, B, E, D ය. (3) C, A, D, B, E ය. (4) C, A, E, D, B ය.

23. රාජ්‍ය මාධ්‍යයන්ගේ ප්‍රධානතම කාර්යය වන්නේ,
(1) රජයේ තීරණ ජනතාව වෙත දැනුම් දීමයි.
(2) රජය පිළිබඳ යහපත් හා හිතකර මතයක් නිර්මාණය කිරීමයි.
(3) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ජනතාවගේ එකඟතාව ලබා ගැනීමයි.
(4) රජය මගින් ක්‍රියාත්මක කරන සංවර්ධන කාර්යයන් සවිබල ගැන්වීමයි.

24. දෘෂ්ටියේ අඛණ්ඩතාව පිළිබඳ සිද්ධාන්තය,
(1) ඇස සහ චලනය වන වස්තුව අතර පරතරය මත රඳා පවතී.
(2) චලනය වන වස්තුවක් දෙස එක එල්ලේ බලා සිටීම නිසා උද්ගත වන්නකි.
(3) වස්තුවක චලන වේගය සහ එය දැකීමට අවශ්‍ය ආලෝක ප්‍රමාණය මත තීරණය වේ.
(4) වේගයෙන් චලනය වන වස්තුවක පිහිටීම් අතර පරතරය නොපෙනීම හේතුවෙන් ඇති වන්නකි.

25. ගුවන්විදුලි මාධ්‍යයේ දී එක් විෂයයක් හෝ විෂය කරුණක් පිළිබඳව විවිධ වූ දෘෂ්ටිකෝණවලින් බලා සකස් කෙරෙන්නේ,
(1) සඟරාමය වැඩසටහන් ය. (2) විචිත්‍රාංග වැඩසටහන් ය.
(3) ප්‍රවෘත්ති වැඩසටහන් ය. (4) සාකච්ඡා වැඩසටහන් ය.

26. 'ග්‍රාහකයින් නොමැතිව මාධ්‍යයට පැවැත්මක් නොමැත.' මෙම ප්‍රකාශය මගින් අදහස් කරනුයේ,
(1) මාධ්‍ය පවත්වාගෙන යනු ලබන්නේ ග්‍රාහකයින් වෙනුවෙන් වන බවයි.
(2) ග්‍රාහකයා, මාධ්‍යයේ අන්තර්ගතය තීරණය කරනු ලබන බවයි.
(3) මාධ්‍යයට ග්‍රාහකයාගේ පාරිභෝගික වටිනාකම අදාළ නොවන බවයි.
(4) ග්‍රාහකයන් මාධ්‍යයට වුවමනා පරිදි කටයුතු කරනු ලබන බවයි.

[හතරවැනි පිටුව බලන්න.

27. යටිකුරු පිරමීඩාකාර වාර්තාකරණයේ දී තොරතුරු ඉදිරිපත් කරන්නේ ඒවායේ,
(1) වැදගත්කම ඉස්මතු වන ආකාරයට ය.
(2) වැදගත්කම යටපත් වන ආකාරයට ය.
(3) වැදගත්කම අඩු වී යන ආකාරයට ය.
(4) වැදගත්කම වැඩි වී යන ආකාරයට ය.

28. රූපවාහිනි රියැලිටි වැඩසටහනක ප්‍රධානතම ලක්ෂණයක් ලෙස හඳුනාගත හැක්කේ,
(1) විශාල වේදිකා පසුතල යොදා ගැනීමයි.
(2) ග්‍රාහක ප්‍රතිචාර සඳහා අවස්ථාවක් සලසා දීමයි.
(3) පිටපත් සැකසීමෙන් හා සංස්කරණයෙන් තොර වීමයි.
(4) කිහිපදෙනෙක්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් සිටීමයි.

29. ශ්‍රව්‍ය ප්‍රකාශන විධි ඇතුළත් වරණය තෝරන්න.
(1) හඬ, නිහඬ බව, සංගීතය හා ශබ්ද
(2) සංගීතය, සංඥා, සංකේත හා හඬ
(3) සංඥා, සංගීතය, නිහඬ බව හා ශබ්ද
(4) සංකේත, නිහඬ බව, සංගීතය හා හඬ

30. මෙම රූපයේ දැක්වෙන්නේ,



(1) රූප සංරචනයයි (composition).
(2) ස්වර්ණමය රීතියයි (the golden rule).
(3) නාභිගත කිරීමයි (focusing).
(4) විභේදන බලයයි (resolution).

31. තොරතුරක් සන්නිවේදනය කිරීමේ දී යම් පුද්ගලයෙකුට තිබිය යුතු ප්‍රධාන හැකියා දෙක දැක්වෙන වරණය කුමක් ද?
(1) නිර්මාණාත්මක හැකියාව, කථන හැකියාව
(2) සන්නිවේදන හැකියාව, ලේඛන හැකියාව
(3) භාෂා හැකියාව, සන්නිවේදන හැකියාව
(4) භාෂා හැකියාව, නිර්මාණාත්මක හැකියාව

32. කිසියම් ආයතනයක වාර්ෂික වාර්තාවේ පිටපත් 50 ක් කඩිනමින් සහ පහසුවෙන් මුද්‍රණය කර ගැනීමට අවශ්‍ය විය. මේ සඳහා වඩාත් යෝග්‍ය විධික්‍රමය වන්නේ,
(1) රෝනියෝ කිරීමයි.
(2) ඩිජිටල් අනුපිටපත්කරණයයි.
(3) ඡායා පිටපත්කරණයයි.
(4) පරිගණක ආශ්‍රිත මුද්‍රණයයි.

33. දෘශ්‍ය සංඥා විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ උත්සහයේ ප්‍රතිඵලය ලෙස,
(1) කැමරාව බිහි විය.
(2) සිනමා මාධ්‍යය බිහි විය.
(3) රූපවාහිනී මාධ්‍යය බිහි විය.
(4) පරිගණකය බිහි විය.

34. පහත ප්‍රකාශ සලකා බලන්න.
A – සේයා පටල භාවිතය අවශ්‍ය නොවීම
B – රසායනික මාධ්‍යයක් මගින් ඡායාරූප සටහන් කරගනු ලැබීම
C – පරිගණක මෘදුකාංග යොදාගෙන පහසුවෙන් ඡායාරූප සංස්කරණය කරගත හැකිවීම
D – සටහන් කරගන්නා ප්‍රතිබිම්බය විද්‍යුත් සංඥාවක් බවට පත් කර දත්ත ගොනුවක් ලෙස ගබඩා කරගැනීම

මේවායින් ඩිජිටල් ඡායාරූපකරණය පිළිබඳ නිවැරදි ප්‍රකාශ වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

35. සාම්ප්‍රදායික සන්නිවේදන භාවිතයන් ඇතුළත් **නොවන** වරණය වන්නේ,
(1) බුලත් දීම, විරිඳු, රූකඩ හා බෙරහඬ ය.
(2) ගිනිමැලය, රූකඩ, කවි කොළය හා සොකරි ය.
(3) කොළ අතු එල්ලීම, ජනකතා, ගිනිමැලය හා හුව ය.
(4) කෙම් ක්‍රම, කවි කොළය, පෝස්ටරය හා තහංචි කවි ය.

[පස්වැනි පිටුව බලන්න.

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

**36.** පරිගණකයක් භාවිත කරමින් තොරතුරු ඉදිරිපත් කිරීම සිදුකළ හැකි වන්නේ,
(1) අන්තර් ක්‍රියාකාරී පුවරුවක් සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මගිනි.
(2) කදා ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහ බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මගිනි.
(3) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහ අන්තර් ක්‍රියාකාරී පුවරුවක් මගිනි.
(4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් සහ ප්‍රතිශීර්ෂ ප්‍රක්ෂේපණ යන්ත්‍රයක් මගිනි.

**37.** සිනමා සම්මාන උළෙලක් අවසානයේ හොඳම නිළිය ලෙස සම්මානයට පාත්‍ර වූ රංගන ශිල්පිනිය වටා රැස් වූ පිරිසක් දැක්වූ අදහස් පහත දැක්වේ.
A - "ඔබේ රඟපෑම අති විශිෂ්ටයි."
B - "ඔබ චරිත තෝරා බේරාගෙන රඟපාන බව පේනවා."
C - "මට තාම ඔබ රඟපෑ මෑත කාලීන චිත්‍රපටයක් නරඹන්නට බැරි වුණා."
මෙම එක් එක් ප්‍රකාශවලට වඩාත් ගැළපෙන ග්‍රාහක වර්ගය පිළිවෙළින්,
(1) සක්‍රිය ග්‍රාහකයෙක්, නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් හා නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් ය.
(2) සක්‍රිය ග්‍රාහකයෙක්, සක්‍රිය ග්‍රාහකයෙක් හා නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් ය.
(3) නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක්, නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් හා සක්‍රිය ග්‍රාහකයෙක් ය.
(4) නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක්, සක්‍රිය ග්‍රාහකයෙක් හා නිෂ්ක්‍රිය ග්‍රාහකයෙක් ය.

**38.** අන්තර්ජාලයේ පළ කරන පුවත්පත් අයත් වන්නේ,
(1) සාම්ප්‍රදායික මාධ්‍යයට ය. (2) නූතන මාධ්‍යයට ය.
(3) ජන මාධ්‍යයට ය. (4) නව මාධ්‍යයට ය.

**39.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) මගින් තහවුරු කර ඇති පුරවැසි හිමිකම කුමක් ද?
(1) තොරතුරු ලැබීමට හා දීමට ඇති අයිතිය.
(2) මතයක් දැරීමට හා ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.
(3) භාෂණයේ, ප්‍රකාශනයේ සහ අදහස් පළ කිරීමේ නිදහස.
(4) තොරතුරු ඒකරාශීකරණයට, දීමට හා ලැබීමට ඇති හිමිකම.

**40.** එක්තරා චොකලට් වර්ගයක් මිල දී ගැනීමේ දී ආකර්ෂණීය අත් පළඳනාවක් නොමිලේ ලබාදෙන බව රූපවාහිනී වෙළෙඳ දැන්වීමක ඇතුළත් විය. එය දුටු චමින් එම චොක්ලට් වර්ගය මිල දී ගෙන දෙන ලෙස මවට ඇවිටිලි කළේ අත් පළඳනාව ලබා ගැනීමේ අටියෙනි. මෙම සිදුවීමට අදාළ සන්නිවේදන ස්වරූපය හා කාර්යය දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) දෘශ්‍ය-පෙළඹවීම (2) ශ්‍රව්‍ය-තොරතුරු සැපයීම
(3) වාචික-සමාජානුයෝජනය (4) අවාචික-විනෝදාස්වාදය

* *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**87 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I, II**
தொடர்பாடலும் ஊடகக்கற்கையும் I, II
Communication and Media Studies I, II

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
※ **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු **20**ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

**1.** දුරකථනය සොයා ගැනීමෙන් පසුව සිදු වූ තාක්ෂණික දියුණුව සන්නිවේදන ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් ඇති කළේ ය.

(i) දුරකථනය සොයාගනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ii) ආරම්භක අවදියේ දී දුරකථනය කවර සන්නිවේදන වර්ගයක් සඳහා භාවිත කළේ ද?

(iii) වීඩියෝ දුරකථන ඇමතුමක දී ග්‍රාහකයාගේ රූපය දැකිය හැකි ය. එහි දී භාවිත කළ හැකි අවාචික සන්නිවේදන විධික්‍රම **දෙකක්** නම් කරන්න.

(iv) දුරකථනය මගින් සම්මන්ත්‍රණ ඇමතුමක් (conference call) ලබා ගන්නා අවස්ථාවක දී භාවිත කෙරෙන සන්නිවේදන වර්ගය කුමක් ද?

(v) දුරකථනය භාවිත කළ **නොහැකි** ප්‍රධාන සන්නිවේදන වර්ගය කුමක් ද?

(vi) ජංගම දුරකථනයක් භාවිත කිරීමේ දී අනුගමනය කළ යුතු ආචාර ධර්ම **දෙකක්** සඳහන් කරන්න.

(vii) සුහුරු ජංගම දුරකථනයක් මගින් අන්තර්ජාලයට පිවිසීමට ඔබට පුළුවන. මාර්ගගතව ඔබට ප්‍රවේශ විය හැකි සමාජ මාධ්‍ය **දෙකක්** නම් කරන්න.

(viii) අන්තර්ජාල පහසුකම් සහිත සුහුරු ජංගම දුරකථනයක් මගින් විද්‍යුත් තැපැල් (email) පහසුකම ඔබට ලබා ගත හැකිය. තවත් පාර්ශ්වයක් වෙත විද්‍යුත් තැපැල් පණිවිඩයක් යැවීමේ දී ඔබ දැනගත යුතු එකී පාර්ශ්වය සතු ප්‍රධාන සාධකය කුමක් ද?

(ix) අන්තර්ජාලයෙහි ඇති විවිධාකාර වූ තොරතුරු සෙවීම සඳහා භාවිත කළ හැකි සෙවුම් යන්ත්‍රයක් (search engine) නම් කරන්න.

(x) අන්තර්ජාලයට පිවිසෙන්නෙකු හට අභිසාරී මාධ්‍ය පරිසරයක අත්දැකීම ලැබිය හැකිය. මාධ්‍ය අභිසාරිතාව යනු කුමක් ද?

**2.** (i) ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් පළමු දෙමළ පුවත්පත කුමක් ද?

(ii) ප්‍රමාණය අනුව ප්‍රධාන පුවත්පත් වර්ග **දෙකක්** නම් කරන්න.

(iii) විවිධ කාර්යයන් සඳහා ඡායාරූප භාවිත කෙරේ. පහත ඡායාරූප වර්ග කෙටියෙන් විස්තර කරන්න.

(අ) වාර්තාකරණ ඡායාරූප
(ආ) ප්‍රවෘත්ති ඡායාරූප
(ඉ) නිර්මාණාත්මක ඡායාරූප

(iv) පුවත්පත් ආයතන හා සම්බන්ධ පහත මාධ්‍ය ශ්‍රමිකයන්ගේ කාර්යභාරය පිළිබඳව වෙන වෙනම සාකච්ඡා කරන්න.

(අ) මාණ්ඩලික වාර්තාකරුවන්
(ආ) ප්‍රාදේශීය වාර්තාකරුවන්

[හත්වැනි පිටුව බලන්න.

[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]

**3.** (i) එදිනෙදා සන්නිවේදනයේ දී භාවිත කෙරෙන ශාරීරික සාධක **දෙකක්** නම් කරන්න.

(ii) සන්නිවේදනය පිළිබඳ හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ නිර්වචනය ලියන්න.

(iii) කාර්යාලයීය සන්නිවේදන මෙවලමක් ලෙස තැපැල් මුද්‍රා යන්ත්‍රය පරිහරණය කිරීම හා සම්බන්ධ කරුණු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) පුවත්පත් ආයතනයක දක්නට ලැබෙන පහත එක් එක් අංශවල ක්‍රියාකාරිත්වයට අදාළ කරුණු **දෙක** බැගින් විස්තර කරන්න.

(අ) ප්‍රවෘත්ති අංශය (news section)

(ආ) විශේෂාංග අංශය (feature section)

**4.** (i) ආසියාවේ ප්‍රථම ගුවන්විදුලි සේවාව ආරම්භ කළ රට කුමක් ද?

(ii) හිමිකම සම්බන්ධියෙන් රාජ්‍ය දායකත්වය සහිත දේශීය ගුවන්විදුලි ආයතන **දෙකක්** නම් කරන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යය පරිහරණය මගින් ළමුන්ට ලබා ගත හැකි ඉගෙනුම් අවකාශ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) ගුවන්විදුලි ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී පෝල් ඩී. මැසනියර් විසින් ඉදිරිපත් කරන ලද සාධක **හතරෙහි** වැදගත්කම වෙන වෙනම පැහැදිලි කරන්න.

**5.** ජනමාධ්‍ය මගින් නිර්මාණාත්මක සන්දේශ ග්‍රාහකයා වෙත ලබාදීමේ දී ආචාරධර්ම පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

(i) නිර්මාණයක දැකිය හැකි ගුණාංග **දෙකක්** ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය භාවිතයට අදාළ ආචාර ධර්ම පද්ධති **දෙකක්** නම් කරන්න.

(iii) රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) 'රූපවාහිනී මාධ්‍යය හා ග්‍රාහකයා අතර අන්‍යෝන්‍ය බලපෑම' පිළිබඳ පහත කරුණු යටතේ පාසල් බිත්ති පුවත්පතට ලිපියක් සම්පාදනය කරන්න.

(අ) රූපවාහිනිය ග්‍රාහක චර්යාව වෙනස් කරයි.

(ආ) රූපවාහිනිය දෛනික න්‍යාය පත්‍රය සකසයි.

**6.** ටෙලිනාට්‍ය මුහුරත් උළෙලක නළු නිළියන් හඳුන්වාදෙන මොහොත සිත්ගන්නා සුළු විය.

(i) ටෙලිනාට්‍යයේ ප්‍රධාන නිළිය ප්‍රධාන නළුවාට වඩා අඳුරු සමක් ඇති යුවතියක් වීම කාගේත් කතාබහට ලක් විය. මෙය කවර සංකල්පයක් යටතේ විග්‍රහ කළ හැකි ද?

(ii) ඉහත අවස්ථාවට අදාළව ලබාගත් ඡායාරූප ප්‍රවෘත්තිමය වටිනාකමින් හීන විය. එසේ වීමට හේතු **දෙකක්** දක්වන්න.

(iii) ටෙලිනාට්‍යයක දී නිශ්චල ඡායාරූප භාවිතයට ගන්නා අවස්ථා **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(iv) 'රාජ්‍ය රූපවාහිනි මාධ්‍ය ආයතන හා රජය අතර සම්බන්ධය' පිළිබඳව පහත කරුණු යටතේ රචනාවක් සම්පාදනය කරන්න.

(අ) රජයේ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ දැනුවත් කිරීම

(ආ) මහජන මතය රජය කෙරෙහි හිතකරව පවත්වාගෙන යාම

**7.** මාධ්‍ය විචාරයේ දී සන්දේශය හුදකලා කොට සැලකීම සාධාරණ නොවේ.

(i) සන්දේශයකින් ඉදිරිපත් වන අදහස කුමක් ද යන්න තීරණය කිරීමට බලපාන සාධකයක් නම් කරන්න.

(ii) විචාරශීලී ග්‍රාහකයකු සතු විය යුතු නිපුණතා **දෙකක්** දක්වන්න.

(iii) ගුවන්විදුලි මාධ්‍යය සඳහා පිටපත් රචනයේ දී සපුරාලිය යුතු කොන්දේසි **තුනක්** විස්තර කරන්න.

(iv) 'අවබෝධයෙන් යුතුව සමාජ මාධ්‍ය පරිශීලනය කරමු' යන මැයෙන් කරුණු **හතරක්** යටතේ පාසල් උදෑසන රැස්වීමේ දී සිදු කරන කතාවකට අදාළ පිටපතක් සකස් කරන්න.

***

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
[ Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers! ]




කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**